# පශ්චාත් යුධ සමයේ ජනතාව මුහුණදෙන සමාජ ආර්ථික ගැටළු පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් (ත්‍රිකුණාමලය, සේරුවිල, දෙහිවත්ත ගම ඇසුරින්)

*ටී.ජී.ඩී උදයකාන්ති* [1]

***ABSTRACT***

***In the sociological study of socio-economic problems faced by people in the post –war period is directed to study how people faced the challenges comeout from the rehabilititation and development programme. Regarding this, survey and data collection is done about people resettlement and correct lands rights, how people built their social environment, how people forget their ethnocentrism view and could they have built cultural integration, and how people's knowledge of war-risks. According to this research 50 family were selected from Dehiwaththe G.S. Division for Seruwawila in Trincomalee.At the data analysis, it was cleared that people were in embarass situation in their law-income situation, also faced the problems of their agricultural life, infra-structure facilities basic – needs communication and social cohesion, social development and rehabilitation programmed is launched by government and non government organization should try to solve those problem.***

**[1]Mrs. TGD Udayakanthi, Lecturer (Temporary) Sociology, BA(Hons) in Sociology (KLN) Department of Social Sciences. E-mail:deepikagamage56@yahoo.com**

## හැඳින්වීම (Introduction)

මානව පරිණාමය සමඟ පරිණාමය වූ යුද්ධය සමාජ කණ්ඩායම් අතර විවිධ ස්වරූපයෙන් දක්නට ලැබෙන අතර එය සමාජ සංවර්ධනයේ කෘත්‍යාත්මක දායකත්වයට වඩා නිශේධනාත්මක බලපෑම ප්‍රබල බව නොරහසකි. එය මනුෂ්‍යය ඉතිහාසය හා අත්‍යන්තයෙන්ම බැඳී පවතින්නකි. මානව ඉතිහාසයේ නොදියුණු යැයි සලකන අවධියේ පටන්ම යුද්ධය පැවතී ඇත. එය දඩයම් යුගයටත් පෙර සිටම ඇති වූ බවට ඉතිහාසඥයින් ගේ සාක්ෂි තුළින් තහවුරු වෙයි. කෙසේ නමුදු පෘථිවිතලය මත මානව වර්ගයා ඇතුළු සමස්ත ජීවි සංහතිය මුහුණ දෙන දරුණුම ඛේදවාචකය යුද්ධය යි. මේ තුළ ඇති වූ ප්‍රතිඵල ඉතාමත් සංකීර්ණ ස්වරූපයෙන් සමාජය තුළ හඳුනාගත හැකි ය. සංවර්ධනයේ ප්‍රමුඛතාව අත්පත් කරගෙන සිටින තාක්ෂණය තුළින්ම යුද්ධය නිර්මාණය කරමින් සංවර්ධනය ආපස්සට හැරවීමේ ද්විත්ව කාර්යය තුළ ලෝකය සංවිධාන ගතවීමේ ප්‍රබල පසුබෑමක් දක්නට ලැබේ.

"පසුගිය වසර 5500 කාලය තුළ මිහිතලය මත යුද්ධ සහ සන්නද්ධ ගැටුම් 15,000 ක් පමණ සිදු වී ඇති බවට විද්‍යාඥයින් විසින් ගණන් බලා තිබේ. මෙම සංඛ්‍යාලේඛනවලින් පැහැදිලි වන්නේ දළ වශයෙන් වසරක් තුළදී යුද්ධ දෙකක් හෝ තුනක්වත් ඇති වී තිබෙන බවයි. මෙම යුද්ධ හෝ සන්නද්ධ ගැටුම් නිසා මිහිතලයට අහිමි වූ මිනිස් ජීවිත ගණන පමණක් කෝටි 354 ක් පමණ වේ. යුද්ධයක් නොමැතිව මෙම වකවානුව තුළ මිනිසා ජීවත් වී ඇත්තේ වසර 292ක පමණ කාලසීමාවක් පමණි. 1987 වසර තුළ දී පමණක් රටවල් අතර යුද්ධ 22 ක් සිදු වී තිබෙන අතර වාර්ෂික යුධ වියදම් ඩොලර් කෝටි 93,000 බව අධ්‍යයන වාර්තාවකින් හෙළි වී ඇත."
(සෙනවිරත්න, 1990: 32)

යුද්ධය හේතු කොට ගෙන ලොව පුරා මිය යන අංගවිකල භාවයට පත්වන, ආබාධිත බවට පත්වන, අනාථ බවට පත්වන සංඛ්‍යාව අතිවිශාලය. මේ සියලු අපරාධයන්ට වගකිවයුත්තා ද මිනිසාම ය. මානව ඉතිහාසයේ අමිහිරි අත්දැකීම් තුළින් ගහණ බිහිසුණුම යුද්ධ අතරින් කොරියානු යුද්ධය වියට්නාම් යුද්ධය, උතුරු අයර්ලන්ත යුද්ධය, පළමු ලෝක සංග්‍රාමය දෙවන ලෝක සංග්‍රාමය හා ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර යුද්ධය නිදසුන් ලෙස දැක්විය හැකි ය.

ශ්‍රී ලංකාව තුළ වසර 30 ක් වැනි කාලයක් තුළ දක්නට ලැබුණු යුද්ධය මානව කේන්ද්‍රණවාදය මත පදනම්ව ජාතීන් අතර මත ගැටුමක් ලෙස ආරම්භ වී පසුකාලීනව සන්නද්ධ ගැටුමක් බවට පත් වූයේ පශ්චාත්කාලීන සමාජ, සංස්කෘතික ප්‍රබල ප්‍රපාතයකට ඇද දමමිනි. මෙම සිංහල ද්‍රවිඩ ගැටුමට මූල බීජ සැපයුණේ ක්‍රි. ව මුල් සියවස තුළ දීය.

පසුකාලීන යටත් විජිත සමයේ දී හඳුන්වා දුන් ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ මගින් තව දුරටත් පෝෂණය වන මෙම අර්බුදය 1948 දී ලැබූ අර්ධ නිදහසින් පසු බලයට පත් වූ රාජ්‍යය නායකයින් හා දේශපාලන පක්ෂ මඟින් ගත් විසඳුම් හා ක්‍රියාමාර්ග පටු දේශපාලන පරමාර්ථ හේතුවෙන් අසාර්ථක නොවූයේ නම් මෙම ප්‍රශ්නය මීට පෙර විසඳීමට ඉඩ තිබිණ. 1956 බණ්ඩාරනායක චෙල්වනායගම් ගිවිසුමත් 1965 ඩඩ්ලි චෙල්වනායගම් ගිවිසුමත් විසඳුම් වශයෙන් යෝජනා වී යම් මට්ටමක ක්‍රියාත්මක වුවද එය සිංහල ද්‍රවිඩ සබඳතාවය තව දුරටත් දුරස්වීමට පසු කාලීනව බලපෑවේ ය.

1971 ප්‍රමිතිකරණ වැඩසටහන් තුළ උගත් ද්‍රවිඩ පිරිසගේ අභිලාෂයන් තව දුරටත් ගිලිහුණු අතර 1981 දිස්ත්‍රික් සභා ක්‍රමය බලය බෙදීමේ ප්‍රයත්නයක් ලෙස ගත්ත ද එය ද අසාර්ථක විය. 1976 දී ද්‍රවිඩ තරුණයන් යුද්ධයකට සූදානම් වූ අතර ඉතිහාසය තුළ ගත් වැරදි තීරණ වල විපාකයන් ස්මතුවන්නේ 1983 කළු ජූලිය තුළිනි. රජයේ හමුදාවේ සෙබළු 13 ක් ඝාතනය කිරීමත් සමඟ දකුණේ සිදු වූ ද්‍රවිඩ සංහාරය හා ප්‍රතික්ෂේප කිරීම් ඉන්දියාවට ද බලපාන ලදී. එනම් එම අවස්ථාවේ දී ජීවිත ආරක්ෂාව පතා ලාංකික ද්‍රවිඩයෝ ඉංදියාවේ කඳවුරු බැඳ ගත්හ. 1985 දී භූතානයේ පැවති කම්ටු සාකච්ඡා එකඟතාවයෙන් තොරව අසාර්ථක විය. 1987 දී රජිව් ගාන්ධි හා ජේ. ආර්. ජයවර්ධන ජනාධිපති අතර අත්සන් කළ ඉන්දු ලංකා ගිවිසුම තුළින් හඳුන්වා දුන් පළාත් සභා ක්‍රමය අපේක්ෂා කළ තරම් සාර්ථක නොවී ය. පසුව 1994 දී පැවති සාකච්ඡා මඟින් පිළිතුරු දීම ප්‍රතික්ෂේප කළ නව සන්ධාන ආණ්ඩුව 2006 දි මාවිල්ආරු සොරොව්ව බලෙන් විවෘත කරමින් ඇරඹි යුද්ධය අවසන් වන්නේ ත්‍රස්තවාදී යුද්ධයට යුද්ධයෙන් පිළිතුරු දෙමිණි.

දශක දෙකකට ආසන්න කාලයක් තුළ සිදු වූ ජීවිත හානි හා දේපල හානි ගණනය කළ හැකි වුව ද සමාජ සංස්කෘතික පසුබෑම තුළ ඇති වූ සංවර්ධන පසුබෑම ගණනය කළ නොහැකි ය. යුද්ධය අවසන්ව සිව් වසරක් ගත වුව ද සමාජය තුළ එම යුධ උණුසුම මැකී ගොස් නැත. සන්නද්ධ අරගලයක්ව පැවති යුද්ධය නිරායුධ වුව ද යුද්ධය පැවති උතුරු නැගෙනහිර ප්‍රදේශවල යුධ කාලය තුළ වර්ධනය වූ දරිද්‍රතාවය අද ද සමාජ ගැටළු රැසකට හේතු වී ඇත. නව දේශපාලන චින්තනයක් තුළ ඉදිරියට යාමට සැලසුම් සකස්කරන ශ්‍රී ලංකාව තුළ පශ්චාත් යුද සමයේ යුද්ධයට මුහුණ දුන් කලාපවල ජනතාවගේ ජීවන පුනරුත්ථාපනය සහ සංවර්ධන කටයුතු වලදී මතුවන ගැටළු නිසිලෙස හඳුනාගතහොත් එම අභියෝග පහසුවෙන් ජය ගැනීමට විධිමත් පුනරුත්ථාපන හා සංවර්ධන ක්‍රියාවලියක් දියත් කළ හැකි ය. යුද්ධය පවතින කාලයේ දී මෙන්ම පශ්චාත් යුධ කාලයේදී යුද්ධයේ බලපෑම යුද්ධයට මුහුණ දුන් සමාජය තුළ දක්නට ලැබෙයි.

## ක්‍රමවේදය (Methodology)

මෙම අධ්‍යයනයේ දී දත්ත රැස් කිරීම සඳහා ප්‍රධාන වශයෙන් සමීක්ෂණ ක්‍රමය භාවිත කළ අතර ඊට අමතරව ඓතිහාසික ක්‍රමය හා කෘත්‍යාත්මක ක්‍රමය භාවිත කෙරිණ. සමීක්ෂණ ක්‍රමය මඟින් දත්ත දායකයාගේ සමාජ ආර්ථික පසුබිම අධ්‍යයනය, රැකියාව, වයස, අනාගත අපේක්ෂාවන් ඔවුන්ගේ යෝජනා, චෝදනා යනාදී තොරතුරු ලබාගැනීම පහසු විය. මෙම පර්යේෂණයට යෝග්‍යතම ක්‍රමය වූයේ සමීක්ෂණ ක්‍රමයයි.

පර්යේෂණයේ දී ගැටළුවක් හා ඒ ආශ්‍රිතව තොරතුරු රැස්කිරීම නිගමනවලට එළඹීමේ දී ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා ආදි ක්‍රම යොදාගෙන තොරතුරු රැස් කිරීම සමීක්ෂණ මඟින් සිදු කරයි. සමීක්ෂණය විස්තරාත්මකව පර්යේෂණ තොරතුරු එකතු කිරීමේ ක්‍රමවේදයකි.

පශ්චාත් යුධ සමය තුළ ජනතාව මුහුණ දෙන සමාජ ආර්ථික ගැටළු හඳුනාගත හැකි වන්නේ එම කලාප වල ජනජීවිත පුනරුත්ථාපන ක්‍රියාවලියේදී ය. මේ අනුව උතුරු නැගෙනහිර ජනතාව පුනරුත්ථාපන හා සංවර්ධන ක්‍රියාවලිය තුළ අභියෝග රැසකට මුහුණ දෙයි. යන උපකල්පනයේ සිට පශ්චාත් යුධ සමය තුළ එම කලාපවල ජනතාව පුනරුත්ථාපන හා සංවර්ධන කටයුතු වලදී මතුවන අභියෝග මොනවාද යන ගැටළුව පිළිබඳ අධ්‍යයනය කරන ලදී. මෙහි අධ්‍යයන අරමුණු වන්නේ

- පශ්චාත් යුධ කලාපීය ජනතාව තම මූලික අවශ්‍යතාවයන් නිසි පරිදි ඉටුකරගැනීදැයි යන්න සොයා බැලීම.
- එම ප්‍රදේශවල ජනතාව නැවත පදිංචි කිරීමේ දී නිරවුල් ඉඩම් අයිතියක් හිමි වී ඇත්දැයි යන්න තහවුරු කර ගැනීම.
- ඔවුන්ට සමාජ ඉඩ ප්‍රස්ථාවන් ලැබේ ද යන්න සොයා බැලීම.
- මානව කේන්ද්‍රනවාදය හා චර්යාවාදී හැඟීම් දුරු කොට ජනතාව අතර සහයෝගිතාවය සහ සංස්කෘතික අනුකලනය යුධ අවධානම පිළිබඳ ඔවුන්ගේ අදහස් මොනවාද යන්න අවබෝධ කරගැනීම.

මෙම අරමුණු මුල් කර ගනිමින් ගැටළු අධ්‍යයනය කරමින් සාධනය කර ගැනීම මෙම පර්යේෂණයෙන් සිදු කෙරිණි.

ඉහත පර්යේෂණය සඳහා යොදා ගනු ලැබූ අධ්‍යයන ක්ෂේත්‍රය වූයේ ත්‍රිකුණාමලය සේරුවිල 217 දෙහිවත්ත ග්‍රාම නිළධාරි වසමයි. මෙහි පවුල් සංඛ්‍යාව 219 කි. මුළු ජනගහනය 655 කි. ඒ අනුව මෙම ක්‍රමය සඳහා සසම්භාවී නියැදුම් ක්‍රමය සාර්ථක ලෙස භාවිතා කරමින් පවුල් 50 ක් තෝරා ගන්නා ලදී.

මෙම දෙහිවත්ත ගම ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සේරුවිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇත. ත්‍රිකුණාමලය ප්‍රධාන

නගරයේ සිට 341Km දුර ගෙවා කන්තලයට පැමිණ ඉන් වමට හැරී සේරුවිල මාර්ගයේ 61Km පැමිණි පසු හමුවන කල්ලයාර් මංසන්ධියෙන් දකුණට හැරී මූතූර් මාර්ගයේ 10 Km පැමිණි පසු දෙහිවත්ත ග්‍රාම නිළධාරී වසම පිහිටා ඇත. උතුරින් සිවපුරම්, නැගෙනහිරින් සහ දකුණින් ලිංගපුරම් සහ බටහිරින් සමගිපුර ග්‍රාම නිළධාරී වසමත් පිහිටා ඇති අතර මෙය මුහුදු මට්ටමේ සිට අඩි 100 ක් උසින් පිහිටා ඇත. මෙහි බහුතරය කෘෂිකාර්මික ජීවන රටාවක් ගත කරන අතර මෙම ගමේ සියල්ලෝම සිංහල බෞද්ධයෝ වූහ. ඔවුහු ලිංගපුරම් සහ සිවපුරම් වැනි දමිළ ජනතාව වෙසෙන ගම්මානවලට මැදිව දිවි ගෙවති.

පශ්චාත් යුධ සමයේ ජනතාවගේ මූලික අවශ්‍යතාවයන් ඉටු කර ගැනීමේ තත්ත්වය පිළිබඳව අවධානය යොමු කළහොත් ඔවුන්ගේ වාසස්ථාන සම්බන්ධව ගත් නියැඳියට අනුව පවුල් 74% ක් තම නිවෙස් වල වාසය කරති. රජයෙන් සකසා දුන් නිවාසවල පවුල් 24% ද බදු නිවාස වල 2% ක්ද වාසය කරති. ඒ අතරින් 66% ක් උළු සෙවිලි කර ඇති අතර 28% ක් පොල් අතු සෙවිලි කළ නිවෙස් ද 4% ක් තහඩු සෙවිලි කළ නිවාස ද 2% ක් ටකරන් සෙවිලි කළ නිවාසයන්හි ද ජීවත් වෙති. බිත්ති වල ස්භාවය ගත්ත ද 30% ක් හුණු කපරාරුව සහිත වේ. 20% ක් සිමෙන්ති කපරාරු සහිතවද 32% ක් මැටි බිත්ති සහිතවද 18% ක් මැටි ගඩොලින් ද බිත්ති නිම කර ඇත. මෙම පවුල් වලට අයත් නිවාස අතරින් 66% ක් බිමට සිමෙන්ති පිරියම් කොට ඇත. සමස්තයක් වශයෙන් ගත් කළ ඔවුන් ජීවත් වන නිවාස වල තත්ත්වය යහපත් මට්ටමක් යැයි කිව නොහැකි ය. මන්ද ඔවුන්ගෙන් බහුතරය තවමත් තාවකාලික (මැටි බිත්ති සහිත) නිවාස වල ජීවත් වෙති. යුද්ධයේ භෞතික විනාශය තුළ යළි ගොඩනැගීමට සැලකිය යුතු කාලපරිච්ඡේදයක් ගත වීම මෙම තත්වයට හේතුවයි.

ජල පහසුකම් වල තත්ත්වය සම්බන්ධව නිරීක්ෂණය කිරීමේදී 52%ක් පෞද්ගලික ළිං වලින් ජලය ලබාගත් අතර පොදු ළිං භාවිතය 16% කි. 32% ක් වෙනත් අයෙකුගේ ජල මූලාශ්‍ර භාවිත කරයි. යුද්ධයට මුහුණ දුන් ප්‍රදේශවල ජනතාව මූලික අවශ්‍යතාවයන් ඉටු කරගැනීම පිළිබඳව සලකා බැලීමේදී නිවාස, ජලය යන අවශ්‍යතාවන් ඉටු වන බවට නිගමනය කළ හැකිය. මන්ද යත් ඔවුන්ගෙන් බහුතරය තමන්ටම අයත් නිවසක වාසය කරන අතර ජලය ලබාගැනීම සඳහා ප්‍රමාණවත් ජල මූලාශ්‍ර ඔවුන් සතුය. මෙම ප්‍රදේශවල ජනතාවට ප්‍රමාණවත් වැසිකිළි සහ සෞඛ්‍ය පහසුකම් දක්නට ලැබුණු අතර තමන්ටම අයත් වැසිකිළි භාවිතය 86% කි. පවුල් අතරින් 82% ක් ජල මුද්‍රිත වැසිකිළි භාවිත කරයි. මොවුන් සියළු දෙනාම රෝග වලට ප්‍රතිකාර ගැනීම සඳහා රජයේ රෝහල භාවිත කරයි. දිගුකාලීන යුද්ධයක ප්‍රතිඵලයක් ලෙස විනාශ වී ගිය මහා මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සිදු කළ ද විකල්ප මාර්ගය තුළ ප්‍රවාහන සේවය මීට

වඩා විධිමත් විය යුතු ය. මන්ද යත් 82% ක් පොදු ප්‍රවාහන සේවය වන අතර එයද විධිමත් නැත.

මෙම පළාත් වල වෙසෙන ජනතාවගෙන් බහුතරය දුගී බවින් පෙළෙනවා පමණක් නොව ඔවුන් දැඩි ආර්ථික අසාධාරණකමින් පෙළෙති. ඔවුන්ගේ ප්‍රධාන ආදායම් මාර්ගය ගොවිතැන හා කුලියට වැඩ කිරීම වේ. එය 44% හා 42% කි. ඔවුන්ගේ ප්‍රධාන ආදායම් මාර්ග වන ගොවිතැනට අවශ්‍යය භූගෝලීය පරිසරයක් තිබුණ ද නව තාක්ෂණික දැනුම නොමැති වීම හේතුවෙන් සාම්ප්‍රදායික වගා ක්‍රමයට ඔවුන් සීමා වී සිටියි. වැදගත් වන්නේ දැනට පවතින නිෂ්පාදන ක්‍රමය සහ ගොවින්ගේ අත්දැකීම් සහ විශේෂඥතාවයන් සමඟ ගැලපෙන තාක්ෂණයකි. කෘෂිකර්මාන්තය සංවර්ධනය කිරීමට පියවර ගැනීමට පෙර තේරුම් ගත යුත්තේ ඔවුන්ගේ අවශ්‍යතාවයන් හා එම ප්‍රදේශයේ පසට උචිත භෝග වර්ගය කුමක්ද යන්න හඳුනා ගැනීමයි. තවද ඔවුන්ගේ ප්‍රධාන වගාව වන වී අස්වැන්න අවුරුද්දේ කන්න දෙකකට ලැබෙන තුරු ඔවුනගෙන් බහුතරයකට යැපෙන්නට ආදායම් මාර්ග නොමැතිවීම දරිද්‍රතා මට්ටම ඉහළ යන්නට ප්‍රධාන හේතුවක් විය.

කෘෂි ජීවන රටාවකට හිමිකම් කියන මෙම ජනතාවගෙන් බහුතරයකගේ මාසික ආදායම 5000 - 10000 අතර වන අතර එය අඩු ආදායම් මට්ටමක් වේ. ප්‍රතිශතාත්මකව එය 52% කි. ඔවුන් වියදම් කරන්නේ ආහාර ඖෂධ වැනි මූලික අවශ්‍යතාවයන් සඳහා පමණි. ඇඳුම් පැළඳුම් මිලදී ගැනීම, උත්සව කටයුතු සඳහා සහභාගිවීම හා මුදල් තැම්පත් කිරීම වැනි පුරුදු ඔවුන්ට නැත. ඊට හේතුව වන්නේ ඔවුන්ගේ ආදායම් ඉතාමත් අඩු මට්ටමක තිබීමයි.

ඔවුන්ගේ දරිද්‍රතා මට්ටම අඩුකරලීම සඳහා ආර්ථික යටිතල පහසුකම් නගා සිටුවීම කෘෂි භෝග වගාවට ඇවැසි ඵලදායිතාවය ඉහළ නැංවීම භෝග විවිධාංගීකරණය, කාර්මික භෝග සහ කෘෂිකර්මාන්තය පදනම් කරගත් කර්මාන්ත ප්‍රවර්ධන, ගොවිපල යාන්ත්‍රිකරණය හා පසු අස්වනු තාක්ෂණය, කෘෂි නිෂ්පාදන අලෙවිකරණය, පර්යේෂණ සහ ව්‍යාපෘති සේවා සංවර්ධනය සහ වගා ක්‍රම කළමනාකරණය කිරීම වැනි ක්‍රමෝපායන් අනුගමනය කිරීම මඟින් ආදායම තත්වය ඉහළ නංවා ගත හැකි ය.

යුද්ධයක් පවතින කාලයේ දී මිනිසුන් තම වාසස්ථාන අතහැර යාම සාමාන්‍යය සංසිද්ධිය කි. යුද්ධය අවසන් වී ඇති කාල සීමාව තුළ ඔවුන් යළිත් තම වාසස්ථාන වෙත පැමිණීම හෝ නැවත පදිංචි කිරීමක් දක්නට ඇත. සමීක්ෂණයට භාජනය කරන ලද නියැදියට අනුව 80% කට යුද්ධයට පෙර සිටි ඉඩම් වල පදිංචි වීමට හැකි වූ අතර 20% ක් නැවත පදිංචි කිරීමේ දී රජයෙන් හිමි වූ ඉඩම් වල පදිංචි වෙන ලදී.

මෙම ප්‍රාදේශීය ජනතාව නැවත පදිංචි කිරීමේ දී නිරවුල් ඉඩම් අයිතියක් හිමි වී ඇති බවට නිගමනය කළ හැකිය. මන්ද යත් නැවත පදිංචි කිරීමේ අමාත්‍යංශය මඟින් එයට අවශ්‍යය නීතිමය පියවර ගෙන ඇති අතර ඉඩම් වල වියවුල් සහගත බවින් මිදීමට හැකියාව ඇත. නමුත් එම නිවාස ආශ්‍රිතව ජලය හා විදුලිය නොමැති වීම හේතුවෙන් ජීවිත යථා තත්වයට පත් කිරීමේ ගැටළු පවතී. එබැවින් ඔවුන් තම නිවාස හා වාසස්ථාන පිළිබඳව සෑහීමකට පත් නොවන බව අධ්‍යයනයෙන් තහවුරු වේ.

සමාජ ඉඩප්‍රස්ථා අහිමි වීම තුළින් ඇති වන ඉච්ඡාභංගත්වය ඕනෑම සමාජයක ගැටුමක පළමු නිමිත්තයි. 1971 දී ප්‍රමිතිකරණ වැඩ සටහන තුළ අහිමි වූ අධ්‍යාපන අවස්ථා හේතුවෙන් සන්නද්ධ වූ ද්‍රවිඩ තරුණ ප්‍රජාව යුද්ධයක් දක්වා එය මෙහෙය විය. මෙම ප්‍රදේශයේ පාසැල් යා යුතු වයසේ සිටින සිංහල ළමුන් පාසල් අධ්‍යාපනය පිළිබඳව තෘප්තිමත් නැත. මානව හා භෞතික සම්පත් හිඟය මීට දැඩි ලෙස බලපාන බවට නිගමනය කළ හැකි අතර මෙම දරුවන්ගෙන් උසස් පෙළ දක්වා ඉගෙනුම ලබන්නේ 8% ක ප්‍රමාණයකි. තව ද පාසල් අධ්‍යාපනය හෝ වෘත්තීය පුහුණු අවස්ථාවක් උදාකර නොගැනීම තුළ ඔවුන් පිළිබඳ වගකිව යුතු බලධාරීන්ගේ අවධානය යොමු නොවීම හෝ ඔවුන් ඒ සඳහා මෙහෙය වීම සිදු නොවන බවට නිගමනය කළ හැකි ය.

පසුගිය වසර පහ තුළ ඔවුන්ගේ ඡන්ද භාවිතය ඉහළ මට්ටමක පැවති අතර බහුතරය කුමන හෝ පක්ෂයක සාමාජිකයෙකු වන බව සමීක්ෂණයෙන් පැහැදිලි විය. ඒ අනුව නිගමනය කළ හැකි වන්නේ යුද්ධයෙන් පීඩා විඳි ඔවුන්ගේ ජීවිතය යථා තත්වයට පත් කිරීමට අපේක්ෂා කළ හැකි වන්නේ දේශපාලන විසඳුමකට පමණක් බැවින් ඒ පිළිබඳව ඔවුන්ගේ දැඩි විශ්වාසයයි. එම විශ්වාසය තහවුරු කරමින් ඔවුන් අපේක්ෂා කරන ජීවන තත්වය උදාකරගතහොත් ඊට විසඳුම් ලබා දුන් දේශපාලන පක්ෂයට හෝ පුද්ගලයින්ට දේශපාලනික වශයෙන් දිගුකාලීන පැවැත්මක් ගොඩනගා ගැනීමට හැකියාව ඇත.

යුද්ධයක් ඇති වීමට ප්‍රධානතම හේතුව වන්නේ අන්‍යෝන්‍ය බැඳීම් වල දුර්වලතාවය යි. වැරදි අවබෝධය සහ මානසික බිඳ වැටීම් තුළ ඇති වන මානසික සට්ටනය ක්‍රමානුකූලව සන්නද්ධ ව්‍යාපාරයක් දක්වා වර්ධනය වේ. සමීක්ෂණය තුළින් හෙළි වන්නේ තවමත් ඔවුන් අතර අන්තර්පුද්ගල සන්නිවේදනය අන්‍ය ජාතීන් අතර තහවුරු කර ගැනීමට සාධක ප්‍රමාණවත් නොවන බවයි. ඔවුන් අන්‍ය ජාතික අන්‍යය ආගමික උත්සව වලට හා අවස්ථාවන්ට සහභාගී නොවීම තුළ ජාති ආගම් අනුකලනය දුර්වල මට්ටමක පවතින බවට නිගමනය කළ හැකි ය. තත්ත්වය තවදුරටත් පැවතිය හොත් ඉච්ඡාභංගත්වය හා අවතක්සේරු කිරීමේ මානසිකත්වයෙන් මිදීමට ඔවුන්ට නොහැකි ය. මේ සඳහා අධ්‍යාත්මික සංවර්ධනය තුළ යම් පියවරක් ගත යුතු අතර ඒ සඳහා සුදුසුම

අවස්ථාව මෙයයි. නමුත් ඔවුන් සමාජයට අනුකලනය වීමේ අවස්ථාව උදාකරගැනීමේ කැමැත්තෙන් සිටින බව පැහැදිලිය. ගම තුළ ඇරඹි මරණාධාර, වනිතා සමිතිවල සාමාජිකත්වය 87% පමණ වීමෙන් ඒ බව තහවුරු වේ.

අන්තර් පුද්ගල සන්නිවේදනය තහවුරු කරන භාෂා භාවිතය පිළිබඳ සැලකීමේදී එය දුර්වල මට්ටමක පවතියි. ඔවුන්ගෙන් 74% ලිවීමට හා කථනයට භාවිත කරන්නේ මව් භාෂාව පමණි. ප්‍රබල සන්නිවේදන මාධ්‍ය වන භාෂාව භාවිතයේ දුර්වල තත්වය තුළ පුද්ගල අදහස් හුදකලා වීමෙන් ඔවුන්ගේ බැඳීම් තවදුරටත් දුරස්වන බවට නිගමනය කළ හැකි ය. ප්‍රදේශයේ ආරක්ෂක තතත්වය පිළිබඳව බහුතරය සෑහීමකට පත්වීමෙන් රජයේ ආරක්ෂක වැඩ පිළිවල සාර්ථක වන බව පැහැදිලි වේ. නමුත් ඔවුන්ගේ අදහස් විමසීමේදී පැහැදිලි වන්නේ තවමත් අනාගත අවිනිශ්චිත තත්වය පවතින බවයි. බහුතරයකගේ මතය වන්නේ නැවතත් යුද්ධයක් ආරම්භ විය හැකි බවයි. ඊට හේතුව ලෙස ඔවුන් දැක්වූයේ ආර්ථික අපහසුතා, අධ්‍යාපනික අවස්ථා, අන්තර් සහයෝගීතාවය තහවුරු නොවීමයි. මෙය ඔවුන් ඉතිහාසය තුළ ලද අත්දැකීම් මත එළඹි නිගමනයක් බව සිතිය හැකි ය. නමුත් මෙය පුනරුත්තාපනය හා සංවර්ධන වැඩසටහන් වලට වැඩි වශයෙන් යොමු වීමෙන් එම අවධානමට නිශ්චිත පිළිතුරක් ලබාදිය හැකි ය.

## *යුද්ධයේ සමාජීය බලපෑම*

ලංකාව තුළ යුද්ධයේ මතවාදීමය අරගලය බ්‍රිතාන්‍යය යටත් විජිත සමයටත් එහා ඉතිහාසයකට උරුමකම් කියයි. එහෙත් එය සන්නද්ධ අරගලයක් ලෙස වර්ධනය වන්නේ 1983 කළු ජූලියේ ප්‍රතිඵලයක් වශයෙනි. මානව සමාජය විකාශය වීමත් සමඟ යුධ තාක්ෂණය හා යුධ ශිල්ප ක්‍රම හා තම ශක්තිය අනෙකා ඉදිරියේ පෙන්වීම සඳහා ඉතිහාසය පුරාවටම මෙම මිහිතලය මත යුධමය තත්වයක් පැවති මොහොතක් ස්ථානයක් සොයා ගැනීම එතරම් අපහසු නොවිය.

යුද්ධයේ යහපත් අයහපත් ප්‍රතිඵල පිළිබඳ අතීතයේ සිටම විවිධ දාර්ශනිකයින් සමාජ විද්‍යාඥයින්, මානව විද්‍යාඥයින් අදහස් පළ කරන ලදී. ඒ පිළිබඳව කෘත්‍යාත්මක ක්‍රමය ඔස්සේ කරුණු ගවේශනය කළ හැකි ය.

යුද්ධයේ අයහපත් බලපෑම ලෙස මිය යෑම, අංගවිකල වීම, අවතැන් වීම තුළ සමාජ සංස්ථාවන්ගේ විකෘති වීම දැකගත හැකි ය. එසේම යුද්ධය හේතු කොට ගෙන අවතැන් වූවන් ලක්ෂ ගණනකි. ඉන් වඩාත් පීඩාවට පත් වන්නේ කාන්තාවන් ළමුන් සහ වයස්ගත පුද්ගලයන් ය. ජනතාවට නිසි කායික පෝෂණයක් නොමැති වීම, පුද්ගලයින් රෝගී වීම, බෝවන රෝග පැතිර යාම සනීපාරක්ෂක කටයුතු නිසි පරිදි ඉටු

නොවීම ආදී සමාජ අපේක්ෂාවන් අහිමි වීම තුළ සිදු වන්නේ තව දුරටත් ඉච්ඡාභංගත්වයට පත් වීමයි. එසේම රට තුළ ආයුධ සංසරණය වැඩි වීම, පුද්ගලයින් මියයාම, අනාරක්ෂිත බව, පාතාල කණ්ඩායම් ඇති වීම යුද්ධයේ අයහපත් ප්‍රතිඵලයන් ය.

උතුරු නැගෙනහිර මෙන්ම රටේ සෙසු ප්‍රදේශවල ද භෞතික සම්පත් විනාශ වී ඇත. යාපනය පුස්තකාලය, මහ බැංකුව, දළදා මාළිගාව, මෙන්ම ස්වභාවික වනාන්තර වනසතුන් විනාශ වී ඇත. එසේම ජනවාර්ගික ඒකාබද්ධතාවය බිඳ වැටීම තුළ සිංහල, ද්‍රවිඩ, මුස්ලිම් ජනවර්ග එකිනෙකට නොසලකා හැරීම සහ අන්‍යොන්‍ය සුහදතාවය නොමැති වීම තුළ එකිනෙකාට විරුද්ධ මතවාදයන් ගොඩනැගීම සිදු වේ. එසේම යුද්ධය යනු සදාචාරයට පටහැනි ක්‍රියාවලියකි. සෑම මිනිසෙකුටම සමාජය තුළ ජීවත් වීමේ අයිතිය ඇත. නමුත් යුද්ධය හේතුවෙන් එම අයිතිය නැති වී ඇත. එසේම සමාජ ධර්මතා හා ඇගයුම් බිඳවැටීම හා වෙනස් වීම සිදු වේ. මිනිසාගේ පැවැත්මට හේතු වන සමාජ ධර්මතා බිඳ වැටීම සමාජ සංවිධානය විසංවිධානකාරී වීමට හේතු වේ. එසේම දූෂ්සමාජානුයෝජනය ඇති වීම හා මානසික ආතතීන්වලට ලක් වූ ජනතාවක් ඇති වීම යුද්ධය හේතු කොට ගෙන සමාජ ප්‍රශ්න රැසක් උද්ගත වීම, අපරාධ ව්‍යාප්තිය, ආයුධ සංසරණය වැඩි වීම, මංකොල්ලකෑම්, මිනීමැරීම්, ස්ත්‍රී දූෂණ, පැහැරගැනීම්, සොරකම්, අවි ජාවාරම්, පාතාල කණ්ඩායම් බිහිවීම යනාදි ගැටළු රැසකට මුහුණ පෑමට සිදු වේ. මීට අමතරව දුගී බව හේතුවෙන් ගණිකා වෘත්තිය, සියදිවිනසාගැනීම්, දූප්පත්කම ආදි සමාජ ප්‍රශ්න ඇති විය. යුධ වියදම් පියවීමට ත්‍රස්තවාදීන් රහසිගතව සිදු කරනු ලබන මත් පැන් හා මත් ද්‍රව්‍ය අලෙවිය සමාජය තුළ අතුරු ප්‍රශ්න රැසක් ඇතිකර ඇත.

යුධමය වාතාවරණය තුළ පවුල් සබඳතා බිඳ වැටීම වැන්දඹුවන් ඇති වීම හා හුදකලා වන දරුවන්ට සමාජ ආරක්ෂාවක් නොමැති වීම මීට අමතරව ආර්ථික පරිහානිය තුළ රටේ සංවර්ධනය ඇණ හිටීම දක්නට ඇත. එසේම යුද්ධයක් පවත්වාගෙන යන්නේ රටේ ජනතාවගේ බදු බර මතයි. ඒ අනුව බදු පනවන්නේ භාණ්ඩ මතයි. සෑම පුද්ගලයෙකුම යුද්ධයක් පවත්වාගෙන යාම සඳහා දායක වන්නේ රජයට බදු ගෙවීමෙන්ය. එනම් යුද්ධය රටක ආර්ථිකය කෙරෙහි ප්‍රබලව බලපෑම් කරයි.

යුද්ධයක් හේතු කොට ගෙන සමාජ සංස්ථාවලින් ඉටු විය යුතු කාර්යභාර්යයන් බිඳ වැටිය හැකිය. එය පශ්චාත් යුධ සමය තුළ ගොඩනැංවිය යුතුය. එසේ නොමැති වූවහොත් සමාජ සංස්ථා විසංවිධානකාරි වීම තුළ නැවතත් සමාජය තුළ ගැටුම්කාරී වාතාවරණයක් ඇති විය හැකිය. ඒ අනුව ආර්ථික සංස්ථාව විධිමත් කරමින් පවුල් සංස්ථාව සුරක්ෂිත කළ යුතුය. එසේම දේශපාලන සංස්ථාව තුළ අරමුණු සාධනයට අවශ්‍යය නිවැරදි තීරණ ගැනීම සිදු කළ යුතුය. නීතිමය

සංස්ථාවට නීතිය ක්‍රියාත්මක කිරීමේදී වගකීමක් පැවරෙන අතර ආගමික සංස්ථාවට ද විශාල වගකීමක් ඇත. ඒ අනුව යුද්ධයේ අයහපත් බලපෑම සමාජ සංස්ථා කෙරෙහි බලපාන ආකාරය හා එහි අයහපත් බලපෑම වැඩි වුවද සමහර කරුණු සමාජ සංස්ථාවේ උන්නතියට හේතු වේ.

රටක හමුදා ශක්තිය වර්ධනය වීම යුද්ධයේ යහපත් ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැකි ය. මන්ද යත් ලොව බලවතුන් තීරණය කරන එක් සාධකයක් වන්නේ යුධමය වාතාවරණයයි. එසේම යුධමය ක්ෂේත්‍රයේ රැකියා ජනිත වීම තුළ විරැකියාවට සාර්ථක විසඳුමක් විය හැකිය. එහිදී අවි නිෂ්පාදනය, අවි ප්‍රවාහනය, යුධ ඇඳුම් නිපදවීම වැනි රැකියා අවස්ථා ඇති වේ. ඒ තුළ යුධමය ආර්ථිකයක් නිර්මාණය වේ. යුද්ධයේ යහපත් ප්‍රතිඵල වලට වඩා සමාජගත වන්නේ අයහපත් ප්‍රතිඵලයි. යුද්ධය සමාජ පර්යාස බිඳ දමන්නක් ලෙස සමාජ විද්‍යාඥයන් අර්ථකථනය කරන්නේ එබැවිනි. පශ්චාත් යුධ කලාපීය ජනතාව යලිත් යුද්ධයක් අපේක්ෂා නොකරයි.

පශ්චාත් යුධ කලාපීය ජනතාවගේ සමාජ ආර්ථික ගැටළු පිළිබඳ අවධානය යොමු කිරීමේදී යුද්ධය පැවති කාල සීමාවේදී මුහුණ දුන් අයහපත් ප්‍රතිඵල හේතුවෙන් සමාජය විශාල පසුබෑමකට ලක් වී ඇත.

### *නිගමනය (Conclution)*

මෙම පර්යේෂණට අනුව පශ්චාත් යුධ කාලීන සමාජයක් තුළ රාජ්‍ය හා රාජ්‍යය නොවන ආයතනවල දායකත්වයෙන් ක්‍රියාත්මක වන සංවර්ධන හා පුනරුත්ථාපන ව්‍යාපෘති ඍජුවම භෞතික සංවර්ධනයට දායක වී ඇති බව පැහැදිලිය. ඒ තුළින් මූලික අවශ්‍යතා තෘප්තිමත් කරගෙන ඇති අතර දේශපාලනික හා අධ්‍යාපනික වැනි සමාජ ඉඩප්‍රස්ථා ලබාගැනීමට උත්සාහ දරමින් සිටියි. නමුත් අධ්‍යාපනික සංවර්ධනයට සුදුසු පරිසරයක් සකස් කරලීමට ගන්නා උත්සාහය දුර්වල මට්ටමක පවතින අතර භෞතික සංවර්ධනයට සාපේක්ෂව මානසික සංවර්ධනය තහවුරු කිරීම තුළින් ජාතික ආගමික හුදකලා බවින් මිදී සමාජ අනුකලනය තහවුරු කිරීම තුළ අනාගත යුධ අවධානම නිශ්චිත වශයෙන්ම පරාජය කළ හැකිය.

ඒ සඳහා භාෂා හා කුසලතා ප්‍රවර්ධන වැඩසටහන් ජාතික මට්ටමින් ක්‍රියාවට නංවමින් සංස්කෘතික බැඳීම් තහවුරු කිරීමට සමාජ ඉඩප්‍රස්ථා ලබා දීම වැදගත් වේ. ඒ අනුව යුධ සමයේ සංවර්ධනය හා පුනරුත්ථාපනයේ දී එම ප්‍රදේශයේ ජනතාව අභියෝග රැසකට මුහුණ දෙයි. එනම් ඔවුන්ගේ මූලික අවශ්‍යතාවයන් ඉටු කර ගැනීමේදී පදිංචි නිවස පිළිබඳව ඔවුන් තෘප්තිමත් නොවීමත් නිවාස වලට අවශ්‍ය ජලජ මූලාශ්‍ර නොමැති වීමත් ප්‍රධාන ගැටළුවක් වේ. ගමට ප්‍රමාණවත් පරිදි ප්‍රවාහන පහසුකම් නොමැති වීම හා තවමත් මාර්ග සංවර්ධනය කරන බැවින් ඊට අවශ්‍ය විකල්ප පිළිතුරු නොදීම හේතුවෙන් අවශ්‍යතා සපුරා ගැනීමේ දී ගැටළු වලට මුහුණ දෙයි. ගමේ බහුතරය වී වගා කරන අතර වසරේ ප්‍රධාන කන්න

දෙකේදී අස්වැන්නෙන් ලැබෙන ආදායම් හැර බහුතරයකට විකල්ප ආදායම් මාර්ග නොමැති වීමද හඳුනාගත් ගැටළුවකි.

එසේම එම ප්‍රදේශවල පාසල් යා යුතු වයසේ සිටින දරුවන් බහුතරය පාසල් යන නමුත් ඔවුන්ට ලැබෙන අධ්‍යාපනයෙන් තෘප්තිමත් නොවන අතර ඊට හේතුව වී ඇත්තේ මෙම පාසල් වල පහසුකම් ප්‍රමාණවත් නොවීමයි. මෙම තත්ත්වය සංවර්ධනයට විශාල අභියෝගයකි. මන්ද යත් නිසි අධ්‍යාපනයක් නොමැති වීම නිසා අනාගත සාක්ෂරතාවය දුර්වල වීමෙන් ඉච්ඡාභංගත්වය තවදුරටත් වර්ධනය විය හැකිය. මෙම ප්‍රදේශවල ජනතාව මුහුණ දෙන ප්‍රධාන අභියෝගයක් වන්නේ භාෂා භාවිතයයි. ඔවුන්ට කථනයට හෝ ලිවීමට හැකියාව ඇත්තේ තම මව් භාෂාව පමණි. තව ද ඔවුන් සංවර්ධනයට යොමු කිරීමේ මානසිකත්වයද දුර්වලය. තවමත් යුධ අවිනිශ්චිතතාව සංවර්ධනයට විශාල අභියෝගයකි. උක්ත ගැටළු වලට සංවර්ධන හා පුනරුත්ථාපන වැඩසටහන් මඟින් විසඳුම් ලබා දිය යුතු අතර ඒ සඳහා රාජ්‍ය හා රාජ්‍යය නොවන සංවිධාන වල ආයතන වල අවධානය තවදුරටත් යොමු විය යුතුය. මෙය කෙටි කාලීන විසඳුම් ලබාදීමෙන් විසඳිය හැකි නොවන අතර දිගුකාලීන ප්‍රතිපත්තිමය තීරණ මත ක්‍රියාත්මක විය යුතු වැඩසටහන් වේ. ඒ අනුව පශ්චාත් යුධ සමය තුළ ජනතාව මුහුණ දෙන සමාජ ආර්ථීක ගැටළුවලට නියමිත විසඳුමක් ලබාදීමට හැකි වේ.

## *ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය (Reference)*


අශෝක, කේ. ජී .(2006). **සමකාලීන සමාජ ගැටුම් විසඳාලීම සඳහා බෞද්ධ ඉගැන්වීම්වල දායකත්වය,** සම්භාෂා, 14 වෙනි කලාපය, අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ ප්‍රකාශනයකි.

උයන්ගොඩ, ජයදේව.(2003). **ගැටුම් සිවිල් යුද්ධ සහ සාමය ගොඩනැගීම,** කොළඹ: සමාජ විද්‍යාඥයන්ගේ සංගමය.

ඔබේසේකර, ධනංජය. (2002). **යුද්ධය සහ ජාවාරම, සාම විමර්ශී.** නොවැම්බර්, දෙසැම්බර් 02 වැනි කාණ්ඩය, 5 වැනි කලාපය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය.

කටුගම්පොළ, රාජා. (2007). **සංග්‍රාම පුරාණය,** කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ

කරුණාතිලක, කේ. (2007). **ප්‍රායෝගික සමාජ විද්‍යාව,** කඩවත: මාලිංග ප්‍රකාශකයෝ.

කරුණාදාස, ඩබ්ලිව්. එම්. (2000). **ජාත්‍යන්තර අර්බුද,** ඉමේජ් ලංකා ප්‍රකාශකයෝ.

කැලේගම, සමන් .(2010). **ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර ප්‍රතිසංස්කරණය සහ පුනරුත්ථාපනය, වැඩසටහන් සහ සීමා, ආර්ථික විමසුම,** පෙබරවාරි/ මාර්තු මහජන බැංකුවේ ප්‍රකාශනයකි.

ගුණරත්න, එම්. චන්දන. (2005). **සමාජයේ ඇති සංයුක්ත බව සහ සමකාලීන ශ්‍රී ලංකාවේ සමාජ ප්‍රශ්න,** කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ .

ජයකොඩි කේ. සරත්. (2000). **තිරසාර සංවර්ධනය සංකල්පනාත්මක න්‍යාය හා ව්‍යවහාරිත්වය,** කැළණිය: විශ්වවිද්‍යාලය, භූගෝල විද්‍යා අධ්‍යයන අංශය.

ජයසිංහ, ඒ. කේ. ජී. (2006). **සමාජ විද්‍යාත්මක න්‍යාය,** කඩවත: කඩුල්ල ප්‍රකාශකයෝ .

ඩයස්,විජේ. (2000). **වර්ගවාදී යුද්ධයකට 25 වසරක්,** කොළඹ:කම්කරු මාවත ප්‍රකාශකයෝ .

දික්වැල්ල, රංජිත්, ප්‍රියන්ත, රේණුකා සහ හෙට්ටිආරච්චි, ශ්‍රියානි. (2003) .**ගැටුම් නිරාකරණ න්‍යාය හා භාවිතය,** වරකාපොළ: ආරිය ප්‍රකාශකයෝ .

ණකමුරා, තකනුසා. (2000). **පශ්චාත් යුධ කාලීන ජපන් ආර්ථිකය,** කොළඹ : සීමාසහිත කරුණාරත්න පුත්‍රයෝ .

පීරිස්, ජිනදාස. (2007). **ජාතික ගැටළුව ගෝත්‍රික රාජ්‍යයේ සිට ගෝලීය රාජ්‍යය දක්වා,** කොළඹ : පික්ස් ඇන්ඩ් වර්ඩ්ස් ප්‍රකාශනයකි.

බාලසූරිය, ඒ. එස්. **ගැටුම් සමථකරණ ක්‍රියාවලිය,** අහිංසා නුගේගොඩ, ගැටුම් නිරාකරණය සහ සාම කේන්ද්‍රය

සෙනවිරත්න, අනුරාධ. (2001). **එකල්හි සිංහලයෝ ද කොටියෝ ද මෙසේ ජීවත් වූහ.** නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

සෙනවිරත්න, ඉන්ද්‍රජිත්. (2000). **සංවර්ධනය,** ගොතටුව: සෙන් ගැෆෝස් ප්‍රකාශන.

සෙනවිරත්න, චාමින්ද. **(1990) නිරායුධකරණය සාමය සහ සංවර්ධනය,** කොළඹ: ඇම්. ඩී ගුණසේන සහ සමාගම .

හයිඩ්, ඩග්ලස් .(1972). **පුනරුත්ථාපනය,** පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා අමාත්‍යංශය, ශ්‍රී ලංකාව.

හිදැල්ලආරච්චි, සී. සී .(2004). **සංවර්ධන අධ්‍යයන,** නුගේගොඩ : සරසවි ප්‍රකාශකයෝ .

Aberatne, Shyamala. (1990). **Rehabilitation of Small Scale Irrigation Systems in Sri Lanka**, International Irrigation Management Institute.

Bale.John &Drakakis, David. (1990). **Rural Development in the third World**, London: Routledge.

Clarance, William. (2007). **Ethnic Warfare in Sri Lanka**, Colombo : Vijitha Yapa.

Cole, Bemjamin.(2006). **Conflict, Terrorism and the Media in Asia**, Abingdoon, Routledge: 2Park square.

Gore, M.S. (2006). **Social Development**, Jaipur: Rawat Publications .

Hawking ,M.Jaycee & Allen Robert. (1991). **Oxford Encyclopedia English Dictionarry**, Oxford : Clarendon Press.

Melean, Iain & Mcmillan, Alistair. (1996). **The Concise Oxford Dictionary of Political**, New York, Macmillan Education Company.

Misra, S.S. (1995). **Ethnic Conflict and Security Crisiis in Sri Lanka**, Delhi: Kalinga Publication.

Nehru, Jawahralal .(1982) .**Glimpses and World History**, New York: Oxford University Press.

Nortor, B.P.& Wihoetz, Philip .(1976) .**Encyclopedia Britannica**, Volume 29.

Radhakrishnan .(1961). **The Hindu View of Life**, Uniwin Book.

Radhkrishnan .(1961). **The Hindu View of Life**, Uniwin Book.

Raman, B , moorthy , N Sathiya & chittaranjjan Kalpana. (2006). **Sri Lanka Peace without Procss**, Colombo : Vijitha Yapa.

Raymond, J Cosini. (1978). **Encyclopeda of phychology**, Villiam Penton Publisher.

Scott, P.W. (1988). **Dictionary of Scialogy**, Delhis:Ashwani Goyal For GOYL SaaB.

Sen Amartya. (2004) .**Resources, Values and Development** , New Delhi: Oxford University Press.

Taylor, A.J.P. (1963). **The Origna of the Second World War**, London: Hamish Hamilton Ltd.

Vamadevan, M .(1989.) **Sri Lanka Repatrates in Tamil Nadu (Rehabilitation and Intergration) Thiruranmiyoor** Madras: Zen Publishers.

Wehmeier, Sally. (1948). **Oxford Advanced Leorner's Dictionary**,New York:Oxford University Press.